# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2081/3 – 2018 ජූලි 23 වැනි සඳුදා – 2018.07.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 167 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/2/2018/CEB/163.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: කඩු/ඉඩම්/03/160/CEB.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ජූලි මස 18 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.–** ප්‍රාදේශීය ලේකම්, කඩුවෙල.

2. **ඉඩමේ විස්තරය.–** බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 480 - වැලිපිල්ලෑව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, දැඩිගමුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/KDW/2018/331 හා 2018.06.25 දිනැති ප්‍රගමන අනුරේඛණයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 1 – පුවක්ගහදෙනිය කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0525**
උතුරට: ඩී. ඩී. ජේ. ප්‍රනාන්දු හිමිකම් කියන පුවක්ගහ දෙනිය කුඹුර සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ ඩී. ඒ. පී. පෙරේරා හිමිකම් කියන පුවක්ගහ දෙනිය කුඹුර; දකුණට: ඩී. ඒ. පී. පෙරේරා හිමිකම් කියන පුවක්ගහ දෙනිය කුඹුර සහ මාර්ගය; බටහිරට: මාර්ගය සහ ඩී. ඩී. ජේ. ප්‍රනාන්දු හිමිකම් කියන පුවක්ගහ දෙනිය කුඹුර.

08 - 282


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.